# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2478/21 – 2026 මාර්තු මස 04 වැනි බදාදා – 2026.03.04**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරළේ සුළු කොට්ඨාසයේ, වීරකෝන්ගම (158 සී) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වීරකෝන්ගම (අ.ග.පි. 289) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/HLD/2021/585 සහ 2022.03.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – වීරකෝන්ගමපතන – ප්‍රමාණය: හෙක්. 0.2023**

උතුරට: අ.ග.පි. 289 හි කැබලි අංක $11^{C}$; නැගෙනහිරට: අ.ග.පි. 289 හි කැබලි අංක $11^{C}$ සහ 11 (ආර්. ඩබ්. ඩී. ටී. රාජසේකර හිමිකම් කියන වීරකෝන්ගමපතන); දකුණට සහ බටහිරට: අ.ග.පි. 289 හි කැබලි අංක 11 (ආර්. ඩබ්. ඩී. ටී. රාජසේකර හිමිකම් කියන වීරකෝන්ගමපතන).

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2021/WS/133.
2025 දෙසැම්බර් මස 19 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැදුර”, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03 – 0001




ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*